
# තුන් නදී කථාව



(මහවැලි කැලණි හා වලවේ ගංගා ජලයෙන් අක්කර ලක්ෂ ගණනක් අස්වැද්දීමට ද ජලගැලීම් වළක්වාලීමට ද ගංබඩ නව නගර තැනීමට ද වහා යෝජනා ක්‍රමයක් ආරම්භ කරන බවෙකි.)

(මේ ලිපිය ඒ තුන් ගංගා පිළිබඳ රසවත් කතා කීපයක් හෙළිකරයි.)

ගහ රුමත් තරුණ කෙල්ලක් මෙන් සාරය. ප්‍රියංකරය. එහෙත් දඟකාරය. හිතුවක්කාරය. එක තැනක සිටි තරුණ කෙල්ලන් තිදෙනකු තුන් පැත්තකට පැන පැන, දිවයන විට ඇතිවන සුන්දරත්වයෙන් මත් නොවන්නේ කවරෙක් ද?

මහවැලි, කැලණි, වලවේ යන ගංගා තුන එකට සිරිපා අඩවියේ සිට තුන් පැත්තට පැන දුවන්නේ ද, තරුණ කෙල්ලන් තිදෙනකු මෙන් හිතුවක්කාර, දඟකාර ගතියකිනි. ඒ සමගම ඒ තුන් ගංගා බඩ පෙදෙස් තරුණියන් දිව යන මහක් මෙන් අමුතු ම සුන්දරත්වයක් ගනී.

සමනොල ගිරි හිසින් පටන් ගෙන උතුරට දිවයන මහවැලි ගහ සැතපුම් 208 ක් මහ ගෙවන්නී අතරමග දී යහළු කෙල්ලන්ට සමකළ හැකි අතු ගංගා විසිපහක් පමණ සිය ගමනට කැඳවාගෙන යන්නීය.

ලග්ගල ඔය, හුනන් ඔය, හුන්ගමල ඔය, බස්ගමුව ඔය, දුනුවිල ඔය, හෙට්ටිපොල ඔය, හීන් ගහ, හැපොල ඔය, උල්හිටිය ඔය, බදුලු ඔය, උමා ඔය, කුරුඳු ඔය ආදිය මහවැලි නදියට එක්වෙයි. පෙම්වතුන්ගේ විනෝදයට සැදුණු බෙලිහුල් ඔය ද පෙණපිඩු සිනා ගත්ව ගත්වා අන්තැනක දී ඊට ම එක්වෙයි.

මාඔය, හුළුගහ, මහඔය, තිලඹේ ඔය, අටබාගේ ඔය, කොත්මලේ ඔය, කවුඩුල්ල ඔය සහ අඹන් ගහ ද ඊට ම එක් කරගන්නා මහවැලි ගහ ප්‍රතාපවත් රාජිනියක් සිය වල්ලභයාට එක් වන්නාක් මෙන් ඇහට දැනී, නොදැනී මෙන් සමුද්‍ර සිපගනී.

ගිමන් කලෙක ඇඳුම් ලිහ ලිහා ඒ ගිමන නිවන සුරූපියක් මෙන් සමහර විටෙක පුලිනතලා දේහය මතුකර පෙන්වමින් ගමන් ගන්නාවූ ද, තවත් කලෙක වැහි බරින් දෙගංබඩ තඹ වතුරෙන් නහව නහවා යන්නා වූ ද, මායාකාරියක් වැනි මහවැලි ගහ, තමාට ම සිනාසිසී ගලන තැන් බොහෝ ය.

තනියම තමාම සිනාසෙන එකියකගේ තක්කඩි, දඟකාර ගතිය මහවැලි නදියට ද උරුමව පවතී. ඩීවෝන් දිය ඇල්ලෙන් ඈ ඇද හැලෙන්නේ වන්නාක් වේවායි සිතන එඩිතර එකියක ලෙසිනි. කන්ද උඩරට දී ඈ මහ මහට පෙනී පෙනී නටතත්, දුම්රිය පාරට ඇතින් පෙනී එය ළං වන විට මුවා වෙයි.

සැන් ක්ලේයාර් ඇල්ල, රම්බොඩ ඇල්ල, කුරුඳු ඔය ඇල්ල, වික්ටෝරියා ඇල්ල, රත්න ඇල්ල ආදියේ දී සිනා සිසී, ගලෙන් ගලට ඈ පෙරළී පෙරළී ගලන්නේ විවාහය ළංවූ එකියක විවාහයේ රස සිත සිතා ඇඳේ පෙරළී පෙරළී ඉන්පසු බිමට ද පනින්නාක් මෙනි.

දුන්හිඳ ඇල්ලේ දී ඈ මනාලියක් මෙන් පෙනේ. කලදෝ පැහැයෙන් බබල බබලා ඇද හැලෙන දුන්හිඳ මහවැලි මනාලියගේ සේලයක් වැන්න. මාතවෙල ඇල්ලෙන් සහ එල්ජින් ඇල්ලෙන් පසු ඈ තැන්පත් ගමනින් යන්නීය.

මහවැලි, යනු මහා වාලුකා නදිය යැයි අප බොහෝ දෙනා කියතත් "වැලි" යන්න ඈත අතීතයේ "ගංභාව" යන අරුත දෙන වචනයක් වූ බව පෙනේ. ආදීම ඉන්දු

ආර්යයන්ගේ යුගයෙහි ඒ ඒ රටවල විශාල ම ගංගාවට 'ගංගාව' යනුවෙන් පමණක් ඇමතීම සිරිතක් වී ඇත. ඉන්දියාවේ විශාලම ගංගාව "ගංගා" වූයේ ද එලෙසිනි.

ඓතිහාසික අතින් ද මහවැලි ගඟ උසස් තැනක් ගනී. රුහුණු, මායා, පිහිටි යන ත්‍රිසිංහලය එක් වනුයේ මහවැලි ගඟේ කටුගස්තොට පාලමට මඳක් ඈතිනි.

කාරුණික වනිතාවක් වන් මහවැලි ගඟ ඇගේ වමත සහ දකුණත මෙන් වෙනස් වූ දරුවන් හා සම්බන්ධකමක් ද ඇත්තියකි.

ලංකා ඉතිහාසයේ අතිශය දැහැමි නරපතියා වූ සිරිසඟබෝ රජතුමා උපන්නේ නදී බඩ මිනිපේ ය. අනෙක් අතින් ලංකා ඉතිහාසයේ අතිශය රණකාමී රජ කෙනකු වූ දෙවැනි රාජසිංහ උපන්නේ නදී බඩ මහියංගනයේ දී ය.

දෙවැනි රාජසිංහ රජතුමාගේ පියාවූ සෙනරත් රජු පරන්ගි සේනාවන්ගෙන් ගැලවීමට දරු උපත ළංවෙමින් සිටි සිය බිසොව ද සමග මහියංගනයට පැන ගියේය. එහි දී රාජසිංහ මෙලොව උපත ලැබුවේය. මාගම සිට උතුරට ගිය ගැමුණු සේනා මහවැලි නදියෙන් එගොඩ වූයේ දිගාමඩුල්ලේදීය. මෑතක් වනතුරු පහත රටියන්, උඩරටට එගොඩවූයේ ගැටඹේ අසල මහවැලි නදියෙනි.

ගන්නෝරුවේ මහ සටන්දා සටන් බිම වැටුණු පරංගින්ගේ ලේ පිසදා ලංකා පොළොව පිරිසිදු කිරීමට මහවැලි නදිය කෙතරම් උත්සාහයක් ගන්නට ඇද්ද? රට, ජාතිය වෙනුවෙන් දිවි පිදූ සිංහලයන්ගේ ලේ ගඟ දියට කවලම්කර ගැනීමට කෙතරම් ආඩම්බර වන්නට ඇද්ද?

එදා මෙන් අදත් වනසතුන්ගේ කිරි මවක් වැනි මහවැලි නදිය රැ ජාමෙහි වල් අලින්ගේ, කෙළි මඩලක් වැන්න. දිවි, වග, වලස්, ඈ නපුරු සතුන්ගේ රැවුම් ගෙරවුම් මැද, ගෝන මුව, ආදී අහිංසක සතුන්ගේ බැලුම්, මැද වන විහඟුන්ගේ ගී රස විඳ විඳ, ඉවසිලිමත් ව මේ මහා ගඟ සමුදුර වෙත ගලන්නී, බාහිර කම්කටොලු සහ කිත් පැසසුම්, මැද කිසිවක් ගණන් නොගෙන සිය එක ම පෙම්වතා සොය සොයා යන අහිංසක එකියක් පරිදිය.

වලවේ ගඟ දකුණ බලා දිවයන්නීය. මහවැලි ගඩ ආරු, දියවිනි ඔය, හුලන්ද ඔය, කුඩා ඔය, තිඩොල් කැටිය ගඟ නොහොත් රක්වාන ගඟ, වැලිඔය යන මාවු ආරු ආදි අතු ගංගා යෙහෙළියන් කැටිව දිව යන්නීය.

"වල්" යනු වනය යන අදහසයි. "වේ" යනු මාර්ගයයි. වග, වලසුන්ගෙන් සහ වල් අලින්ගෙන් ගහන මහ වනය මැදින් යන සුරූපියකට කිනම් සිනා ද? සැතපුම් 83 ක් ම ඈ මුහුදු හිමි සොය සොයා ගමන් ගන්නේ බර කල්පනා වෙනි. කෙතරම් ගැඹුරු අදහස් ඇති එකියකට වුව ද ඉඳහිට වත් සිනාවක් පහළවීම එතරම් පුදුමයක් ද නො වේ. ඒ සිරිත අනුව බේකර්ස් ඇල්ලේ දී සහ ගල්ගම ඇල්ලේ දී වලවේ ගඟ ද පොඩි අහර දහරයක් දමා මුකුළු කර කර සිනා සිසී යන්නීය.

වලවේ ගඟ, නමින් අනුරූප් නම් මහ වනය ඈ අවට රජ දහනක් කරගෙන සිටීම පුදුමයක් නොවේ.

එහෙත් ගඟ මැදක් හරියේ දී මැණික් ගරන්නවුන් විසින් සොයා ගෙන ඇති පැරණි ගල් ආයුධ වලවේ පෙදෙසට ඉතිහාසයක් ඇඳයි.

ස්වභාවයා විසින් මඳ සුළඟට මල් රොන් මුසුකරන්නාක් මෙන් වලවේ ගඟට ද අමුතු කථාවක් එයින් එකතු වී ඇත. ඒ ගල් ආයුධ ආදිය විජය රජුටත් ඉහත දී ලංකාවේ විසූ මිනිසුන් විසින් ප්‍රයෝජනයට ගන්නා ලදැයි කෞතුකාගාර අධ්‍යක්ෂක දැරණියගල මහතා නිගමනය කරයි. අද වල් බිහි වලවේ පෙදෙස එදා ජනාකීර්ණ මිනිස් වාසයක් වී තිබෙන හැටි.

වලවේ ගඟ මුහුදට වැටෙන තැන වූ අම්බලන්තොට පිළිබඳ අතීත කථාවක් ඇත. වලවේ මෝය අසල ගිරිකන්ද නමින් හඳුන්වනු ලබන ස්තූපයකි. මේ ස්තූපය බඳින ලද්දේ තපස්සු භල්ලුක යන වෙළඳුන් දෙදෙනා විසින් ගෙන එන ලද බුදුන් වහන්සේගේ කේශ ධාතු නිදන් කිරීමෙනැයි ගැමි වරක් පවතී. ඒ කෙසේ වෙතත් ගිරිකන්ද ස්තූපය අසළ තිබී සොයා ගන්නා ලද අමරාවතී සම්ප්‍රදායයට අයත් කැටයම් සහිත කිරිගරුඬ ගලක් නිසා ඒ ස්ථානය යම්කිසි වැදගත් ඓතිහාසික ස්ථානයක් බව නම් නො රහසකි.

බෙලිහුල් ඔයේ එක් කොටසක් මහවැලි ගඟට එක්වූයේ තවත් කොටසක් වලවේ ගඟට ද එක්වෙයි. පෙම්වතා දැක ගැනීමට කෙටි මඟක් සොයමින් එහෙ මෙහෙ දුවන දඟකාර කෙල්ලක් වැන්න බෙලිහුල් ඔය.

කැලණියෙන් නම ලද කැලණි ගඟ, සිංහල කවීන්ගේ වැණුම්, සහ සිංහල රණ ශූරයින්ගේ සටන්, දුටු ප්‍රතාපවත් වූ ස්වභාවික නිර්මාණයකි.

එකම ලතාවකට, වැනි වැනී ඇඹරි ඇඹරි, නැමි නැමී තෙල් පාට ගැසුණු එකියක් මෙන් කැලණි ගඟ සිය නිල් දිය කඳ ගෙනයයි.

"රාජා හෝ මාහෝ ගංගා හෝ" කියමන සිහි කරවන බැරන්ඩි කෝවිල අසල දී සීතාවක ගඟ, සීතාවක නදිය ඊට එක්වෙයි. මස්කෙළිඔය, කෙහෙල්ගමුව ගඟ, ගුරුගොඩ ගඟ, රිටිගල ඔය, වැ ඔය, පූගොඩ ඔය, මිතිරිගල ඔය, පුස්වැලි ඔය, වක්ඔය, ගැටහැත්ත ඔය, පල්ලේවෙල ඔය, ඇක්කිඔය සහ ලියන් ඔය ඇගේ ගමනට යෙහෙළියන් වීමෙන් ගමන තව තවත් සාරවත් වෙයි.

තැන්පත් එකියක් මෙන් ඈ උවමනා තැන දී ඒ තැනේ හැටියට සිනාසෙන්නීය. ඇබර්ඩීන් ඇල්ලෙහි දී, සහ

ලක්ෂපාන, ඇල්ලෙහි දී ඈ නටනටා සිනාසෙන්නීය.

කොලපුවෙන් දැදිරි වූ පුවක් මලක් මෙන් පුවක් මල ඇල්ල කැලණි ගඟට ඔබින සිනාවක් පළකරන්නීය. දෝ තුළු ඇල්ලෙන් සහ ඇලපිට ඇල්ලෙන් ඈ තවත් රසවති.

සිරිපා සෙවනේ සිට සැතපුම් 90 ක් දුර මුහුදු සැමියා සොය සොයා එන කල්‍යාණිය සීතාවක රාජසිංහගේ එඩිතර සටනින් රැලි ගීයෙන් උදන් ඇනුවාය. මහවැලි ගඟ මහියංගනයේ දී මෙන් කැලණි ගඟ කැලණියේ දී බුදුරදුන් දැක සතුටේ තඹවතුරු නංගන්නට ඇත.

සිරිරහල් හිමියෝ කැලණි ගඟබඩ නා මෙනවියන් දුටහ.

මන හර නා මෙනෙවිය හිදළ වැළි පි ට
ගෙන මිණි වෙණ නත් මැද තියගින් රුව ට
කණ හෙව කියන බුදු ගුණ ගී මියුරු කො ට
සැණ හෙව කැලණි ගඟබඩ මඳ කලක් සි ට

අපේ කවියා සමනොල හිසින් නික්මෙන මේ ගංගා සියල්ල ම දැක්කේය.

එදුරු කතර සිට ආකල මනර ඟ
පඳුරු ලලා එන දිය කඳ සිව් ර ඟ
රූ දුරු නොයෙක් කඳු හෙල් ගෙවමින් ම ඟ
ඉ දුරු දිගට වැටුනේ වලවේ ග ඟ

වැටෙනා රන් රන් මේ රඟ රඟ යා
බසිනා ඇල දොල ගුගුරන රඟ යා
බස්නාහිර දිග කැලණි ගඟේ යා
සැල ජල පිරි තැන් යන දිය රල යා

මාඇලි දොලිනුත් එන තද වතු රු
රී ලොලි වඩවන පිපි මල් තඹු රු
බාලොලි වඩවන කෙත්වත් සපි රු
මාවැලි ගඟ නික්මුනි දෙස උතු රු

මේ තුන් ගංගාවන් සහාය කොට ගෙන "පෙරළියක්" කිරීමට ඉඩම් සංවර්ධන ඇමතිවරයා අදහස් කරයි. පැරණි සිංහලයන් ද මේ ගංගා අතර තුර පෙරළියක් කළ බව "රාජාවලිය" මෙසේ සඳහන් කර ඇත.

"ශ්‍රී භුවනෙකබාහු රජ්ජුරුවන් රාජ්‍යය කරන අවධියට පස් යොදුන් කෝරළය, කැලණිදොල ශ්‍රී ජයවර්ධනපුර රාජයා කැරගම හිමියාණන් එක්ව කථා කරගෙන කළු ගඟින් එපිට වලවේ ඔය දකිනා තුරු සිංහල පෙරළි කළේය.

මීට අවුරුදු සියයකට පමණ ඉහත දී ත්‍රිකුණාමලයේ සිටි බෲක්ස් නමැති නාවික නිලධාරියෙක් මහවැලි ගඟ පහළට බින්තැන්න තෙක් ඔරුවකින් ගියේය. ත්‍රිකුණාමලේ සිට සැතපුම් 80 ක් පමණ ගඟ තරණය කළ පසු එම නිලධාරියාට මහත් අකරතැබ්බයකට මුහුණ පාන්නට සිදුවිය. එතැන සිට ගඟ වාලුකා ගතිය අත්හැර ගල් පර ගතියකට පෙරළුන හෙයින් ඔහුට ඔරුව ගඟබඩ ඇදගෙන යාමට සිදුවිය.

(මීමන ප්‍රේමතිලක සූරීන්ගේ වල්අලින් සහ වැද්දන් මැද කෘතියෙන් උපුටාගන්නා ලදී.
එම්. ඩී. ගුණසේන සහ සමාගමේ අනුග්‍රහයෙනි.)